ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

**නිකුත් කළේ** : බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව

**දිනය** : 2019 සැප්තැම්බර් 18

## ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී ආයතනය සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙන ඇති නියාමන ක්‍රියාමාර්ග

2011 අංක 42 දරණ මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මුදල් සමාගමක් වන ද ෆිනෑන්ස් කම්පැනි පී එල් සී ආයතනය, 2008 වර්ෂයේ දී එම ආයතනය අයත්ව තිබූ සෙලින්කෝ සමාගම් සමූහයේ මූල්‍ය ආයතන ගණනාවක සිදු වූ බිඳ වැටීම හේතු කොට ගෙන දැඩි බලපෑමකට ලක් විය. එතැන් පටන් ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී ආයතනයේ මූල්‍ය තත්වය ක්‍රමයෙන් පසුබෑමට ලක් වූ අතර වර්තමානය වන විට ඉතා ඉක්මනින් විසඳිය යුතු උග්‍ර ද්‍රවශීලතා අර්බුදයක් බවට පත්ව ඇත. ආයතනය යථා තත්වයට පත් කිරීමේ අරමුණින් අපේක්ෂිත ආයෝජකයන් හඳුනාගැනීම සඳහා අවස්ථා ගණනාවකදී ප්‍රයත්නයන් දැරුවද එම ප්‍රයත්නයන් තවමත් ප්‍රමාණාත්මක වශයෙන් සාර්ථක වී නොමැත.

ද ෆිනෑන්ස් කම්පැනි පිඑල්සී ආයතනයේ පවතින දුර්වල මූල්‍ය කාර්යසාධන මට්ටම සලකා බැලූ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ආයතනයෙහි තැන්පත්කරුවන්ගේ සහ අනෙකුත් ඇල්මක් දක්වන පාර්ශවයන්ගේ හිමිකම් සුරක්ෂිත කිරීම සඳහා 2011 අංක 42 දරණ මුදල් ව්‍යාපාර පනතේ ප්‍රතිපාදන යටතේ නියාමන ක්‍රියාමාර්ග ගණනාවක් 2019 පෙබරවාරි 15 දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි බලාත්මක කරන ලදී. එම නියාමන ක්‍රියාමාර්ග අතර ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම වෙනුවෙන් නව තැන්පතු බාර ගැනීම අත්හිටුවීම, තැන්පතු ආපසු ගැනීම අත්හිටුවීම, ණය හා අත්තිකාරම් ප්‍රදානය අත්හිටුවීම ආදිය අන්තර්ගත වේ. නියාමන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ මූලික පරමාර්ථය විභව ආයෝජකයෙකු හඳුනා ගැනීම සඳහා ද

ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී ආයතනයට සාධාරණ කාලසීමාවක් ලබාදීමයි. කෙසේ වුවද මේ වනතුරුත් ආයතනය නැවත නඟා සිටුවීම සඳහා පිළිගත හැකි මට්ටමේ ආයෝජකයෙකු සොයා ගැනීමට ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී ආයතනය අසමත් වී ඇත.

**ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී ආයතනයේ නැවත පිබිදීම මුළුමනින්ම රඳා පවතින්නේ ආයතනයේ හිමිකම් ප්‍රාග්ධනයේ ආයෝජනය කිරීමට කැමැත්තක් දක්වන මෙන්ම පිළිගත හැකි මට්ටමේ ආයෝජකයෙකු මත පමණක් බව වටහා ගැනීම වැදගත් ය.** මේ අනුව ආයතනයේ මූල්‍ය තත්වය තවදුරටත් පිරිහීම වැලැක්වීම සඳහා එකඟ වූ කාලරාමුවක් තුල ආයතනය වෙත හිමිකම් ප්‍රාග්ධනයක් රැගෙන ආ හැකි පිළිගත හැකි ආයෝජකයෙකු සොයාගැනීම මේ මොහොතේ අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව මුදල් මණ්ඩලය විසින් ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී ආයතනය වෙත වහාම ක්‍රියාත්මක වන පරිදි විභව ආයෝජකයන්ගෙන් කැමැත්ත පළ කිරීමේ ලිපි කැඳවීමටත් එම ආයෝජකයන්ගෙන් ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා යෝජනා ඉල්ලීම් කිරීමටත් නියෝග කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවතින නීති හා රෙගුලාසි වල යටත්ව ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී ආයතනයට සුදුසු ආයෝජකයන් සමග කටයුතු කිරීමට  අවශ්‍ය පහසුකම් සපයනු ඇත. තව ද **ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර පනත යටතේ පැවරී ඇති බලතල අනුව ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී ආයතනය සඳහා වන විභව ආයෝජකයන් වෙත පහසුකම් සැලසීම සඳහාත් තැන්පත්කරුවන්ගේ සහ අනෙකුත් ණයහිමියන්ගේ යහපත සුරක්ෂිත කිරීම සඳහාත් ආයතනයේ පිරිවැය තවදුරටත් අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ද ඇතුලත් ව 2019 පෙබරවාරි 15 දින සිට පනවන ලද නියාමන ක්‍රියාමාර්ග 2019 සැප්තැම්බර් 15 දින සිට මාසයක කාලයක් සඳහා දීර්ඝ කිරීමට තීරණය කර ඇත.**

තැන්පත්කරුවන්ට තම තැන්පතු වෙනුවෙන් ලැබිය යුතු පොළී මුදල් ගෙවීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන්ට අනුකූලව අඛණ්ඩව සිදු කරන අතර ආයතනය වෙතින් ණය පහසුකම් ලබා ඇති සියලුම ආකාරයේ ණයගැතියන් ආයතනය වෙත ගෙවිය යුතු සියලු ගෙවීම් නිසි පරිදි කල යුතු බවට තරයේ අවවාද කර සිටී. ආයතනය වෙත එම ණයගැතියන් ගෙවිය යුතු මුදල්, ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී ආයතනය විසින් නියම කර ඇති බැංකු ගිණුම් මඟින් හෝ ආසන්නම පිහිටි ශාඛාව හරහා සිදුකරන ලෙසත් තමන් සිදු කල ගෙවීම් වෙනුවෙන් නිසිපරිදි ලදුපත් ලබා ගන්නා ලෙසත් දැනුම් දී සිටිමු.

තවද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක ක්‍රමය යටතේ සියලුම තැන්පතුකරුවන්ගේ තැන්පතු, එක් තැන්පතුකරුවෙකු වෙනුවෙන් රු. 600,000/- උපරිම සීමාවකට යටත්ව ආවරණය කරගැනීමේ හැකියාවක් පවතින අතර මෙමඟින් සමස්ත තැන්පත්කරුවන්ගෙන් සියයට 94 ක ප්‍රතිශතයකට තම මුළු තැන්පතු මුදලම ආවරණය කරගැනීමේ හැකියාව පවතී. මේ නිසා කැමැත්ත පළ කිරීමේ ලිපි කැඳවීම ඔස්සේ සිදු කරනු ලබන සුදුසු ආයෝජකයෙකු සොයා ගැනීමේ ක්‍රියාවලිය

කළමනාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සහයෝගීව ක්‍රියාකරන මෙන් තැන්පතුකරුවන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටී.

මේ සම්බන්ධව වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 0112477573, 0112477229 හෝ 0112477504 යන දුරකථන අංක මගින් තැන්පත්කරුවන්ට සම්බන්ධ විය හැක.